# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/15 - 2013 ජූලි මස 17 වැනි බදාදා - 2013.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය : පී/4/1/2/ඩබ්/19.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:*

03ජේ/92/ඩබ්එස්/39.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ මුල්ලේගම ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2003.02.16 දිනැතිව මැන සකස් කරන ලද අංක මහ. 5442 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් දැක්වෙන "වාගොල්ලතැන්නේ කුඹුර" නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0125ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක:

**කැබලි අංක 1; ඉඩමේ නම: වාගොල්ලතැන්නේ කුඹුර; ප්‍රමාණය: හෙක්. 0.0099**

| | | |
|---|---|---|
| *උතුරට* | : | වාගොල්ලතැන්නේ කුඹුර; |
| *නැගෙනහිරට* | : | වාගොල්ලතැන්නේ කුඹුර; |
| *දකුණට* | : | වාගොල්ලතැන්නේ කුඹුර, මු. පි. මහ 3332හි 1 වැනි ඉඩම් කැබැල්ල සහ සිමෙන්ති කානුව; |
| *බටහිරට* | : | සිමෙන්ති කානුව සහ වාගොල්ලතැන්නේ කුඹුර. |

*හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය:*

1. භාරකාර ස්වාමීන් වහන්සේ, අස්ගිරිය මහා විහාරය, මහනුවර.

2. මහා භාරකාරතුමා, මහාභාරකාර දෙපාර්තමේන්තුව, කොළඹ 07.

**කැබලි අංක 2; ඉඩමේ නම: වාගොල්ලතැන්නේ කුඹුර; ප්‍රමාණය: හෙක්. 0.0026**

| | | |
|---|---|---|
| *උතුරට* | : | වාගොල්ලතැන්නේ කුඹුර සහ සිමෙන්ති කානුව; |
| *නැගෙනහිරට* | : | සිමෙන්ති කානුව සහ මු. පි. මහ 3332හි 1 වැනි ඉඩම් කැබැල්ල; |
| *දකුණට* | : | මු. පි. මහ 3332 හි 1 වැනි ඉඩම් කැබැල්ල සහ මු. පි. මහ 3563 හි 1 වැනි ඉඩම් කැබැල්ල ; |
| *බටහිරට* | : | මු. පි. මහ 3563 හි 1 වැනි ඉඩම් කැබැල්ල සහ වාගොල්ලතැන්නේ කුඹුර. |

*හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය:*

1. භාරකාර ස්වාමීන් වහන්සේ, අස්ගිරිය මහා විහාරය, මහනුවර.

2. මහා භාරකාරතුමා, මහාභාරකාර දෙපාර්තමේන්තුව, කොළඹ 07.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 ඔක්තෝබර් මස 02 වැනි දින ප. ව. 2.00ට පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.




*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තව ද, 2013.09.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

එම්. ඩබ්ලිව්. එම්. එම්. මඩහපොල  
ප්‍රාදේශීය ලේකම්,  
පූජාපිටිය.

2013 ජූලි මස 12 වැනි දින,  
පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 111

---

## ශුද්ධි පත්‍රිකාවයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 3/1/2/9.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2003/E/576.

2005 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 1411/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* III කොටසේ ඉඩම් යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7වැනි වගන්තිය යටතේ, අංක 10-47 දැන්වීමෙහි අ. ග. පි. 877 කැබලි අංක 43 සඳහා සඳහන් දිනය ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයක් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉවත් කළ යුතු දිනය: | ඉවත් කළ දිනය වෙනුවට ආදේශ කළ යුතු දිනය: |
|---|---|
| 2005.11.21 | 2013.09.16 |

ටී. එම්. එම්. එස්. ඒකනායක,  
ප්‍රාදේශීය ලේකම්,  
මාවතගම.

2013 ජුනි මස 18 වැනි දින,  
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 113

---

## ශුද්ධි පත්‍රිකාවයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ඩීඑස්/එම්එන්/සී/එල්බී/4516ඒ.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 03ජේ/86/ඩී/136.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ අංක 1033/4 හා 1998.06.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමේ හිමිකම් පරීක්ෂණ දිනය 1998.07.30 යන්න 2013.08.15 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පිඹුරු අංකය : පිපි/මඩ/1274

ඉඩම් කැබලි අංක 07 - ප්‍රමාණය හෙක්. 2.060

ඉඩම් කැබලි අංක 09 - ප්‍රමාණය හෙක්. 0.886

ඉඩම් කැබලි අංක 10 - ප්‍රමාණය හෙක්. 0.791

එස්. ගිරිධරන්,  
ප්‍රාදේශීය ලේකම්,  
මන්මුනේ උතුර,  
මඩකලපුව.

2013 මැයි මස 08 වැනි දින,  
මන්මුනේ උතුර, මඩකලපුව,  
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 112

.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.